# මහත්ඵල ලැබීමට දන් පිංකම් කළ යුතු ආකාරය.

දේශකයාණෝ
අති පූජ්‍ය ත්‍රිපිටකාචාර්ය මහා කම්මට්ඨානාචාර්ය
නාඋයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ

පූජ්‍ය මොරගොල්ලේ
සුමනයෝගී ස්වාමීන් වහන්සේ
විසින් සංස්කරණය කරන ලද මුල්පොත
අනුව මුද්‍රණය කරණ ලදී.

# මහත්ඵල ලැබීමට දන් පිංකම් කළ යුතු ආකාරය.

© : අති පූජ්‍ය නාඋයනේ අරියධම්ම හිමි.

උතුම් ධර්ම දානය පිණිසයි.
(අලෙවිය සඳහා නොවේ)

ධර්ම දාන සඳහා මුද්‍රණ විමසීම්.

මුද්‍රණය

දිමුතු මුද්‍රණාලය
අංක 103/A, නුවර පාර, යක්කල.
දුරා: 033-2239662 / 077-8829705
විද්‍යුත් තැපෑලා: dimuthupub@yahoo.com
දහම් පොත් කියවීම සඳහා පිවිසෙන්න.
වෙබ්: www.dhammadanabooks.com

# හැඳින්වීම

ඔබ අප සැමට ඉතා කෙටි කාලයක් තුළ ධර්ම දාන පිංකම් කිහිපයක් සිදු කිරීමට අවස්ථාව උදා වූයේ නොසිතූ ලෙසය.

මුලින් මුද්‍රණය කළ මහා නිමි ජාතකය බොහෝ දෙනා ඉතා අර්ථවත් ලෙස පාසැල් පුස්තකාල, විහාරස්ථාන ආදියට ද ලබාදී ඇති බව දැනගන්නට ලැබුණි. එය ඉතා හොඳය. මෙම පොත ද එවැනි ස්ථානවලට ලබාදීමත්, අතිනත යැවීමත් තුළින් වැඩි ධර්ම ප්‍රචාරයක් ලැබේ. එසේ දුන් එක් පොතක් ඇසුරින් ගුවන් විදුලි ධර්ම දේශනයකට කරුණු ගත් බවද දැන ගන්නට ලැබුණි. ගියවර පොත් 500 බෙදීමේදී ඉතා අපහසුවක් ද විය.

මෙවර පොත් 1000ක් පමණ මුද්‍රණයට කළණ මිතුරෝ කීපදෙනෙක්ම එක්වූහ. ඉදිරියේදී තවත් එක්වනු නිසැකය.

ඉතා කාරුණික වූ නා උයනේ අරියධම්ම නා හිමි, හේනේගම භාවනා මධ්‍යස්ථානයේදී මෙම පොත ඇතුළු තවත් කිහිපයක් මුද්‍රණයට ලබා දී පින් අනුමෝදන් කරන ලදී. ඔබ විසින් මුණ ගැසිය යුතු එවන් උතුමන් රාශියක් නා උයන වන ගත ආරණ්‍යයේ වැඩ වෙසෙති. විශේෂයෙන් නා හිමියන්ගේ කරුණාබර වදනක් පාසා පුදුමාකාර ගුණයක්, මිහිරක්, ගැඹුරක් ඇත. ඒ සංවර ගමන් විලාසය, මද සිනහව, මතකය අනන්ත වූ පාරමී ශක්තිය බව සැබෑය.

හිමියන් බැහැදැකීම නෙතට රසඳුනකි, බොහෝ විට නා උයනේ උන්වහන්සේ වැඩ වෙසෙන කුටිය බුදුමැඳුරක අසිරිය ගනී. අනාගත උදය වරුවක එවන් අවස්ථාවක් ඔබට උදා වේවා. ශ්‍රී

ලංකාවේ මෙවන් හිමිවරු වැඩ විසීම අසන්නට පවා ලැබීම අප ඔබ ලද වාසනාවකි. උන්වහන්සේගේ සියලු ප්‍රාර්ථනා ඉටුවේවා! දීර්ඝායුෂ ලැබේවා!

පොතක් කියවීමෙන් අප හට බොහෝ කරුණු ඉගෙන ගත හැක. එසේම ජීවිත කාලයටම නොලැබෙන අත්දැකීම්, ජීවන ගැටළු, ඉතා කෙටි වේලාවක් තුළ ලබා ගත හැකි වුවත් විශේෂයෙන් ධර්මයේ ඇති එක් කරුණක් වත් තමා තුළින් වර්ධනය කර ලබන අත්දැකීම, සුවය, සමාධිය පොතක් කියවීමෙන් ලැබිය නොහැක. ඒ නිසා අප්‍රමාදීව ගුණ ධර්ම තමා තුළ වගා කළ යුතුවේ.

මෙම පොත් මුද්‍රණයේදී අප හට ආශිර්වාද කර නා උයන වාසී පූජ්‍ය අඟුල්ගමුවේ අරියනන්ද හිමි, පූජ්‍ය සීලගම ඥානසිරි හිමි ඇතුළු සියලුම ලෝකවාසී ස්වාමීන් වහන්සේලාට මෙම පින් අත්වේවා! ඔබ සියලු දෙනාගේ යහපත් පැතුම් ඉටුවේවා! ඉතා ඉක්මනින් මේ ඝෝර කටුක භයංකාර සසරෙන් එතෙර වී ලබන අමාමහ නිවන් අවබෝධ වේවා!

කෙටි කලකින් මෙම පොත මුද්‍රණය කරදුන් දිමුතු මුද්‍රණාලයේ අධිපති එච්.එම්.එච්. බණ්ඩාර මහතා ඇතුළු කාර්යමණ්ඩලයේ සැමටත් අමා මහ නිවන් සුවයම ලැබේවා! කියා ප්‍රාර්ථනා කරමු.

*සාධු ! සාධු ! සාධු !*

නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස!!!

# මහත්ඵල ලැබීමට නම් මෙසේ දන් පිංකම් කළ යුතුය.

**යෝ සීලවා සීලවන්තේසු දදාති දානං**
**ධම්මේන ලද්ධං සූපසන්න චිත්තෝ**
**අභිසද්ධහං කම්ම ඵලං උළාරං**
**තං වේ දානං විපුල ඵලංති භ්‍රෑමීති**

ශ්‍රද්ධාවන්ත පිංවතුනි!

තුන්ලෝකාග්‍ර වූ, භාග්‍යවත් වූ, අර්හත් වූ, සම්‍යක් සම්බුද්ධ, සර්වඥ රාජෝත්තමයන් වහන්සේ මහා කරුණාවෙන් ලෝ වැසි ජනතාවගේ සුවසෙත උදෙසා වදාළ දක්ඛිණ විභඞග සූත්‍රයේ අවසාන ගාථාවයි ධර්ම දේශනාව සඳහා ඉදිරිපත් කරන්නට යෙදුණේ.

| | | |
|---|---|---|
| ❖ යෝ සීලවා | - | යම් කෙනෙක් සීලවන්තව |
| ❖ සීලවන්තේසූ දදාති දානං | - | සීලවන්තයන් හට දානයක් දෙනවා නම් |
| ❖ ධම්මේන ලද්ධං | - | දැහැමින් ලද දානයක් දෙනවා නම් |
| ❖ සුපසන්න චිත්තෝ | - | අතිශයින්ම ප්‍රසන්න සිතින් යුතුව දානය දෙනවා නම් |

❖ තං වේ දානං විපුල ඵලන්ථි භ්‍රැමි - එම දානය මහත් අනුසස් ගෙන දෙන දානයක්ය.

කියන එකයි ගාථාවේ කෙටි තේරුම. මහා බෝසතුන් වහන්සේ බුදු බවට පත් වී අවුරුද්දක් ගිය තැන විසි දහසක් මහ රහතන් වහන්සේලා සමඟ කපිල වස්තු නුවරට වැඩම කොට වදාළේ පිය මහ රජතුමාට ධර්ම අනුග්‍රහ කරනු පිණිසයි. පළමු දවස හරියට වෙසක් පෝයදා උදා වුණා. තථාගතයන් වහන්සේ තම ඥාතීන්ට බුදුමහිම දක්වනු පිණිස අහසට පැන නැගී රුවන් සක්මනක් මවා නිර්මිත බුදු රුවක් ද මවා, ඉරියව් මාරු කරමින්, ධර්ම දේශනා ධර්ම සාකච්ඡා කරමින්, යමා මහ පෙළහර පාමින් එම අවස්ථාවේදී යමා මහ ප්‍රාතිහාර්යය පා වදාළා. එම ප්‍රාතිහාර්යය අවසානයේදී මහා පෘථිවිය ද කම්පා වුණා. අහසේ මල් වැසි ද වැස්සා. කෝටි ලක්ෂයක් දෙවියන් බ්‍රහ්මයන් රහත් වුණා. අසංඛ්‍යයක් පිරිස සෝවාන් වුණා, සකෘදාගාමී වුණා, අනාගාමී වුණා, මවුපිය ඥාති කුල අසූ දහසක්, පිය පස ඥාති කුල අසූ දහසක් දෙනා මුලින් කැපූ කෙසෙල් කඳන් මෙන් බිම දිගා වෙලා තෙරුවන් සරණ ගත වුණා.

නිග්‍රෝධ උයන පිළිගෙන එහි වැඩ ඉන්න ටික දවස ඇතුළතදී ඊළඟ දෙවන දවසේදී පිඬුසිගා වඩිද්දී පියමහා රජතුමා සෝවාන් ඵලයට පැමිණෙව්වා. එදා දවසේදී ම, රජ වාසලේ දානය වළඳා, දහම් දෙසා පිය රජතුමා සකෘදාගාමී ඵලයට පැමිණෙව්වා. ඊළඟ දවසේදී "නන්ද" කුමාරයා පැවිදි කෙරෙව්වා. හත්වන දවසේදී "රාහුල" කුමාරයා පැවිදි කෙරෙව්වා. අටවන දවසේදී "මහාධර්මපාල" ජාතක දේශනාවෙන් මහ රජතුමා අනාගාමී මාර්ගයෙන් අමා මහ නිවණට පැමිණෙව්වා. ඉන් නොබෝ දවසකදී "මහා ප්‍රජාපතී ගෝතමී දේවීන් වහන්සේ" බුද්ධ පූජාවට චීවරයක් සූදානම් කර ගත්තා. බුද්ධ පූජාව සඳහාම පුළුන් පොළල, නූල් කැටල, රෙදි වියල, බුද්ධ චීවරය, සුගත චීවරය සූදානම් කර ගත්තා. මේ චීවරය කඩ කපල, මහල, පඬු පොවල, අංග සම්පූර්ණ කරල, හිස මුදුනේ තබාගෙන ගොස් නිග්‍රෝධාරාමයේදී දණ නමාගෙන වැඳගෙන ආරාධනා කළා....... ස්වාමීනි! සම්මා සම්බුදු පියාණන් වහන්ස!...... මෙම චීවරය මගේ අතින් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී දේහයට පෙරවන්නට සකස් කළේ. එබැවින් තථාගතයන් වහන්ස! මා කෙරෙහි අනුකම්පාවෙන් මෙම චීවරය පිළිගෙන මා කෙරෙහි අනුකම්පාවෙන් පරිහරණය කරන සේක්වා කියා ආරාධනා කළා.

මේ මහා ප්‍රජාපතී දේවීන් වහන්සේ කල්පනා කළා........ සිද්ධාර්ථ කුමාරයන් වහන්සේ ඉපදී දින හතකින් මව්තුමිය ස්වර්ගස්ථ වුණා. එදා පටන් කිරි ටික පෙව්වේ මමයි, බත් ටික කැව්වේ මමයි, වතුර නැව්වේ මමයි, ඇඟ ඇතිල්ලුවේ මමයි, නියපොතු බැවේ මමයි, ඇඳුම් ඇන්දෙව්වේ මමයි, තුරුලුකරගෙන සැතපෙව්වේ මමයි.

ඒ උත්තමයන් වහන්සේ අද සවණක් ඝන බුදු රැස් විහිදුවමින්, දසත ලෝක ධාතුවෙහි දහම් වැසි වස්සවමින්, තුන්ලොවට පිහිට වෙමින් රන් කඳක් මෙන්, රන් ඇගෑයක් මෙන් බබළනවා. උන්වහන්සේට මාගේ අතින්ම චීවරයක් කරවා පූජා කරන්න ඕනෑ කියල හිතලයි, ඒ විදිහෙන් වටිනා චීවරයක් සකස් කරල පෙරහැරකින් ගෙනවිත් භාග්‍යවතුන් වහන්සේට පූජා කළේ, මව්තුමිය තුන් වාරයක්ම ආරාධනා කළා මේ චීවරය පිළිගන්න, ඒත් භාග්‍යවතුන් වහන්සේ චීවරය භාර ගත්තේ නැහැ. උන්වහන්සේ තුන් වාරයක් වදාළා.

**සංඝේ ගෝතමී දේහි සංඝේ තේ දින්නේ**
**අහංචේව පූජිතෝ භවිස්සාමි සංඝෝච**

ගෝතමීන් වහන්ස! මේ චීවරය සංඝයාට පූජා කරන්න, සංඝයාට පූජා කළාම, මටත් පූජා කළා වෙනවා. සංඝයාට පූජා කළත් වෙනවා. ඒ අවස්ථාවේදී මේ සිදුවීම බලාගෙන සිටි ආනන්ද ස්වාමීන් වහන්සේ ආරාධනා කළා ස්වාමීනි! භාග්‍යවතුන් වහන්සේට කුඩා කාලයේදී කිරි පොවා හදා වඩා පෝෂණය කළ මේ ආ සුලු මෑණියන්ට අනුග්‍රහ පිණිස, අනුකම්පා පිණිස, මේ චීවරය පිළිගන්නා සේක්වා කියා ආරාධනා කළා. මේ වාගේ ආනන්ද ස්වාමීන් වහන්සේද තුන්වාරයක්ම ආරාධනා කළා.

ඒ අවස්ථාවේදී ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ, ඉදිරියේ මහා ප්‍රජාපතී ගෝතමීන් වහන්සේ චීවරය අතේ තබාගෙන වැඳගෙන පසෙක සිටිද්දී, තවත් විශාල පිරිසක් දෙසවන් යොමා සවන් දී සිටිද්දී, ආනන්ද ස්වාමීන් වහන්සේ අමතා භාග්‍යවතුන් වහන්සේ වදාළ, ආනන්දය! මේ ලෝකේ තිබෙනවා, පෞද්ගලික දාන දාහතරක්, මෙම බුදුසසුනේ සාංඝික දාන හතක්

තිබෙනවා. දක්ෂිණා විශුද්ධි හතරක් තිබෙනවා. ඒ මොහොතේදී මේ සියල්ලම උන්වහන්සේ විස්තර කළා. ඒ අතරින් පළමුවෙන්ම පහදා වදාළේ පුද්ගලික දාන දාහතරක් පිළිබඳවයි.

එයින්,

❖ **පළමුවන දානය නම්,**

යම් කෙනෙක් ආහාර අනුභව කරල, අත සෝදා ඉඳුල් වතුර ටික ඉවත දානකොට මෙසේ හිතනවා නම්, මේ ඉඳුල් වතුරේ තිබෙන ආහාර රසය, පොළවේ ඉන්න කුඩා කෘමීන්ට ආහාරයක් වේවා. ඔවුන්ට සැප පිණිස වේවා! කියල හිතාගෙන ඉඳුල් වතුර ටික ඉවත දමනවා නම් ඒ සෑම දෙනාටම ආත්ම සියයක් ආනිශංස ගෙනදෙන දානමය පින්කමක් වෙනවා. එය පළමුවන පෞද්ගලික දානයයි. බලු කපුටු ආදී සතෙකු හට හෝ කෑම වේලක් දුන්නා නම් ආනිශංස සියයක් අනුසස් ගෙන දෙන පිනක් වෙනවා. මේ දානය තිරිසන්ගත සතෙකුට දෙන දානය පළමු වැන්නයි.

❖ **දෙවන දානය නම්,**

තිසරණයවත් සමාදන් නොවූ පංච ශීලයවත් ආරක්ෂා නොකරන දුශ්ශීල මනුෂ්‍යයෙකු හට ආහාර වේලක් පරිත්‍යාග කරනවා නම් ආත්ම දහසකදී එහි විපාක වශයෙන් අනුසස් ගෙන දෙනවා.

❖ **තුන්වන දානය නම්,**

පංච ශීලය මනාව රකින අබෞද්ධ කෙනෙකුට යම් කෙනෙක් විසින් ආහාර වේලක් දෙනවා නම් ආත්ම ලක්ෂයක් එහි විපාක වශයෙන් ආනිශංස ගෙන දෙනවා.

❖ **හතරවන දානය නම්,**

ධ්‍යානලාභී බාහිර තාපස කෙනෙකු හට ආහාර වේලක් පිරිනමනවා නම් ආත්ම කෝටි ලක්ෂයකදීම ආයු වර්ණ සැප බල ප්‍රඥා ලබන්නට උපකාර වෙනවා. මේ මුලින් සඳහන් කළ දාන හතරම ශාසනයෙන් බැහැර තිබෙන දාන, එම හතරම බුද්ධ ශාසනයෙන් බාහිරයි.

❖ **ඊළඟ පස්වන දානය නම්,**

බෞද්ධයෙකුට දෙන දානයයි. යම් කෙනෙක් තිසරණ ගතව බෞද්ධයෙක් වශයෙන් ජීවත් වෙනවා, නම් එතුමා ජීවත් වෙන්නේ සෝවාන් මාර්ගය සඳහායි. ඒවාගේ සෝවාන් මාර්ගයට පිළිපන් කෙනෙකු හට යම් කිසි කෙනෙක් එක ආහාර වේලක් පරිත්‍යාග කළා නම් ආත්ම අසංඛෙය්‍යකදී ආයු, වර්ණ, සැප, බල, ඥාණ ලබන්නට උපකාර වෙනවා.

❖ **හයවන දානය නම්,** සෝවාන් කෙනෙකුට දෙන දානයයි.

❖ **හත්වන දානය නම්,**

සකෘදාගාමී මාර්ගයට පිළිපන් කෙනෙකු හට දෙන දානයයි.

❖ **අටවන දානය නම්,** සකෘදාගාමී කෙනෙකු හට දෙන දානයයි.

❖ **නවවන දානය නම්,**

අනාගාමී මාර්ගයට පිළිපන් කෙනෙකු හට දෙන දානයයි.

❖ **දහවන දානය නම්,** අනාගාමී කෙනෙකු හට දෙන දානයයි.

❖ **එකොළොස්වන දානය නම්,**

රහත් මාර්ගයට පිළිපන් කෙනෙකු හට දෙන දානයයි.

❖ **දොළොස්වන දානය නම්,**

රහතන් වහන්සේ කෙනෙකු හට දෙනු ලබන දානයයි.

❖ **දහතුන්වන දානය නම්,**

පසේ බුදුරජාණන් වහන්සේ කෙනෙකුට දෙන දානයයි.

❖ **දාහතරවන දානය නම්,**

මුලු මහත් ජම්බුද්වීප තලයම බෙර ඇසක් මෙන් සමතලා කරල ආසනයෙන් ආසනයට සමීපව අසුන් පනවා, පසේ බුදුරජාණන් වහන්සේලා එක පේළියයි, රහතන් වහන්සේලා පේළි දෙකක්,

අනාගාමීන් වහන්සේලා පේළි තුනක්, සකෘදාගාමීන් වහන්සේලා පේළි හතරක් සෝවාන්, ආර්‍යයන් වහන්සේලා පේළි පහක් වශයෙන් වඩා හිඳුවා උන්වහන්සේලාට ප්‍රණීත චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලාන ප්‍රත්‍යය ආදියෙන් යම් කෙනෙක් පූජා කරනවා නම් එම පිනට වඩා එකම එක ලොව්තුරා සම්මා සම්බුදු රජාණන් වහන්සේ නමකට යම් කෙනෙක් දානයක් පිරිනමනවා නම්, එම පින මහත් ඵලයි මහත් ආනිශංසයි. මේ වාගේ පෞද්ගලික දාන දාහතරක් එදා වදාළා. ඒ අතරින් ශාසනික වශයෙන් දාන දහයක්ද, ශාසනයෙන් බාහිරව හතරයි, සියල්ල දාහතරයි, මෙම පෞද්ගලික දාන එසේ පහදා වදාළ සර්වඥයන් වහන්සේ සාංඝික දාන හතක් දේශනා කොට වදාළා.

❖ සාංඝික දාන හත අතරින් පළමුවන දානය නම්,

බුද්ධ ප්‍රමුඛ උභය සංඝයා (භික්ෂු/ භික්ෂුණී) සංඝයාට දෙනු ලබන දානයයි.

❖ දෙවන සාංඝික දානය නම්,

බුදුරජාණන් වහන්සේ නැති කාලයේදී භික්ෂු භික්ෂුණී උභය සංඝයාට පිරිනමනු ලබන දානයයි.

❖ තුන්වන සාංඝික දානය නම්,

භික්ෂු සංඝයාට පමණක් දෙනු ලබන සාංඝික දානයයි.

❖ හතරවන සාංඝික දානය නම්,

භික්ෂුණී සංඝයාට පමණක් දෙනු ලබන සාංඝික දානයයි.

❖ පස්වන දානය නම්,

භික්ෂූන් වහන්සේලාගෙන් මෙපමණයි. භික්ෂුණීන් වහන්සේලාගෙන් මෙපමණයි කියලා, සංඛ්‍යාවක් කරල, ප්‍රමාණයක් කරල, උභය සංඝයාට පිරිනමනු ලබන දානය පස්වන සාංඝික දානයයි.

❖ හයවන සාංඝික දානය නම්,

භික්ෂූන් වහන්සේලා යම් ප්‍රමාණයක් වශයෙන් පවරලා දෙනු ලබන දානයයි.

❖ හත්වන සාංඝික දානය නම්,

භික්ෂුණීන් වහන්සේලා මෙපමණයි කියලා ප්‍රමාණයක් කරලා භික්ෂුණීන් වහන්සේලාට දෙන සාංඝික දානයයි.

අද කාලයේ දී බුදුරජාණන් වහන්සේ නැති බැවින් සහ භික්ෂුණීන් වහන්සේලා ලෝකයේ නැති බැවින් භික්ෂූන් වහන්සේලා පමණක්ම ලොව වැඩ සිටින බැවින් එම සාංඝික දාන හත අතරින් භික්ෂු සංඝයා වෙත දෙනු ලබන තුන්වන දානය සහ හයවන සාංඝික දානය යන දාන දෙක පමණක් අද කාලයේදී පිරිනැමිය හැකි වෙනවා. සෙසු දාන පහම මේ කාලයේදී දිය නොහැකි වෙනවා.

ඉන් අනතුරුව භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ දක්ෂිණා විශුද්ධි හතරක් පහදා වදාළා. එම දක්ෂිණා විශුද්ධි හතර අතරින්,

❖ **පළමුවන දක්ෂිණා විශුද්ධිය නම්,**

එම දානය දෙන දානපතියා සීලවන්තයි, දානය සඳහා යොමු කරන දාන වස්තුව පරම ධාර්මිකයි. එතුමාගේ සිත සෝමනස්ස සහගතයි. ඥාන සම්ප්‍රයුක්තයි. දානය ලබන ප්‍රතිග්‍රාහක පිරිස දුශ්ශීලයි.

මේවාගේ දෙනු ලබන දානය ලබන්නාගේ පැත්තෙන් ප්‍රතිග්‍රාහක පිරිස දුශ්ශීල පිරිසක් වුණත්, දානය දෙන දානපතියා ශීලවන්ත කෙනෙකු බැවින්, එම දානය මහත්ඵල වෙනවා. මහානිශංස වෙනවා. මෙය පළමුවන **දක්ෂිණා විශුද්ධියයි.**

වෙස්සන්තර මහා රජ්ජුරුවෝ එදා අලි ඇතා දන් දුන්නේ තමන්ට වඩා සීලවන්තයන්ට නොවෙයි. නෙත් දෙක වගේ දරු දෙදෙනා දන් දුන්නේ තමාට වඩා සිල්වතෙකුට නොවෙයි. එසේ නමුත් බෝධි සත්ත්ව මහා වෙසතුරු රජතුමාණන්, පරම සීලවන්තයි, දාන වස්තුව පරම ධාර්මිකයි, චිත්ත සන්තානය ඉතා පිරිසිදුයි, ඤාණ සම්ප්‍රයුක්තයි. එබැවින් ඒ මහා බෝසතුන් වහන්සේගේ එම දානය මහත් ඵල වුණා. මහානිසංස වුණා පමණක් නොව, දෙලක්ෂ සතලිස් දහසක් යොදුන් ගනකම තිබෙන, මෙම මහා පොළවට දරා ගන්නට නොහැකිව කම්පා වෙන්න පටන් ගත්තා.

ඒ කුමක් නිසාද? ඒ දානය පිළිගන්න ප්‍රතිග්‍රාහක පක්ෂයෙන් මහත් ඵල නොවුණත්, දානය දෙන දායක පක්ෂය පැත්තෙන් මහත් ඵල වන ආකාරයයි. තිරිසන්ගත සතෙකු හට වුණත් පංච සීලය පමණක් රකින මනුෂ්‍යයෙකු හට වුණත් දෙනු ලබන දානය තුළින් ආත්ම සිය ගණන්, ආත්ම දස දහස් ගණන්, ආත්ම ලක්ෂ ගණන් මහත් ඵල ගෙන දෙන්නේ දානපතිතුමාගේ ගුණවත් බව වශයෙනුයි. මෙහි පළමුවෙනි **දක්ෂිණා විශුද්ධියයි.**

### ❖ දෙවන දක්ෂිණා විශුද්ධිය නම්,

දානය පිළිගනු ලබන ප්‍රතිග්‍රාහක පක්ෂය සීල සම්පන්නයි. දන්දෙන දායක පක්ෂය සීලයක් නැහැ. දාන වස්තුවත් ධාර්මිෂ්ඨ නැහැ. අදැහැමින් උපයා සපයාගත් වස්තුවයි. සිතත් පැහැදීමක් නැහැ. ඥාණ සම්ප්‍රයුක්ත වන්නෙත් නැහැ. එහෙත් එම දානය දෙන පක්ෂය දුශ්ශීල වුණත්,

දානය පිළිගන්න ප්‍රතිග්‍රාහක පක්ෂය සීල සම්පන්න බැවින් ප්‍රතිග්‍රාහක පක්ෂය නිසා දානය මහත් ඵල වෙනවා.

කැළණි ගඟ අසබඩ, කේවට්ටයෙක්, "දීඝ සුමන" නැමැති රහතන් වහන්සේ නමකට වාර තුනක්ම පිණ්ඩපාත දානය පූජා කරලා තිබුණා. ඔහුගේ ජීවනෝපාය බිලී බෑම, මසුන් මැරීම, ඔහුගේ වස්තුව අධාර්මිෂ්ඨයි. ඔහුගේ සිතේ පැහැදීමකුත් නැහැ. කර්ම ඵල විශ්වාස කිරීමට තරම් නුවණක් ද ඔහුට නැහැ. එසේ නමුත් අර වාර තුනක්ම, රහතන් වහන්සේ නමකට දාන පූජා කිරීමේ පින සිහිපත් වීමෙන් ඔහු මරණින් පසු සුගතියට ගියා. එම දානය ඔහුට මහත් ඵල වුණේ දානය ලබාගත් ප්‍රතිග්‍රාහක පක්ෂයෙන්.

### ❖ තුන්වන දක්ෂිණා විශුද්ධිය නම්,

දානය දෙන දායක තුමාගේ සීලයක් නැහැ. දානය පිළිගන්න, ප්‍රතිග්‍රාහක පක්ෂයත් දුශ්සීලයි. වස්තුවත් අධාර්මිශ්ඨයි. සිතේ පැහැදීමක් ද නැහැ. නුවණක් ද නැහැ. මෙබඳු කෙනෙකු දෙනු ලබන දානය දෙපැත්තෙන්ම අල්ප ආනිසංශයි, අල්ප ආනුභාවයි. දන් දෙන, දානය ලබන දෙපාර්ශවයම දුශ්සීල බැවින්, එය තුන්වන දානයයි.

❖ **හතරවන දක්ෂිණා විශුද්ධිය නම්,**

යෝ සීලවා දාන පතිතුමා පරම සීලවන්තයි. සීලවන්තේසු දදාති දානං දානය ලබන ප්‍රතිග්‍රාහක පක්ෂයත් සීලවන්තයි. ධම්මේන ලද්දං දාන වස්තුවත් පරම ධාර්මිශ්ඨයි උපයා සපයා ගෙන තිබෙන්නේ සූපසන්න චිත්තෝ චිත්ත සන්තානයත් අතිශයින්ම ප්‍රසන්නයි. අභිසද්ධහං කම්ම ඵලං උළාරං, දානපතිතුමා දන්දීමෙන් ලැබෙන ඵල පිළිබඳව මෙනෙහි කිරීමේ විශ්වාස කිරීමේ නුවණින්ද යුක්තයි. **"තං වේ දානං විපුල ඵලංති බ්‍රෑමි"** මෙම දානය නම් දාන දායක පැත්තෙන් සහ, දානය පිළිගන්න ප්‍රතිග්‍රාහක පක්ෂයෙන් යන දෙපාර්ශවයෙන්ම, මහත් ඵල මහානිශංස වන විපුල වූ උදාර පුණ්‍ය ඵලයක් ලැබෙන හතරවන දක්ෂිණ විශුද්ධියයි, කියා සියල්ල දන්න සම්මා සම්බුදු රජාණන් වහන්සේ මහත් කරුණාවෙන් පහදා වදාළා.

මෙම කරුණු අනුව අපි සලකා බලන්න ඕනෑ. අපි මේ සම්බුදු සසුනේ සිදු කරන දම් පින්කම් පිළිබඳව. අපි මෙම ශාසනයෙහි නා නා

ආකාරයේ අනේක විධ, දම් පින්කම් සිදු කරනවා නේද? ඒ අතරට මහා සංඝ රත්නය වෙත පිණ්ඩපාත දානය, චීවර පූජා දානය, කුටිසෙනසුන් පූජා කිරීමේ දානය, ජල පහසුකම් සඳහා ළිං පොකුණු කරවා පූජා කිරීමේ දානය, විහාර දාගැබ් මළු ඉදිකරවා පූජා කිරීමේ දානය මේ වාගේ නා නා ආකාරයේ පින්කම් රැසක්ම බෞද්ධයන් වශයෙන් බොහෝ දෙනා සිදු කරනු ලබනවා නේද?

මේ වාගේ උතුම් බුදු සසුනක මෙබඳු පින්කම් සිදු කිරීම තුළින් අපිට මොන තරම් අනුසස් බල මහිමයක් ලැබෙනවාද? කියන එක මෙම දක්ෂිණා විශුද්ධි දේශනයට අනුව සලකා බලා තේරුම් ගන්නට ඕනෑ.

එම දේශනාවේදී සම්මා සම්බුදු රජාණන් වහන්සේ පහදා වදාළ...... දානමය පින්කමක් සිදු කිරීමේදී දන් දෙන දානපතිතුමා (දායක පක්ෂය) සීලවන්තව සිටීම එම දානය මහත් ඵල වීමට හේතුවන එක් අංගයක්, දන් දෙන දායක පින්වතුන් තම තමාට

අයත් නිත්‍ය ශීලයක හෝ ගිහි පින්වතුන් වශයෙන් නම් පංච සීලයේ හෝ අධිසීල සංඛ්‍යාත උපෝශථ අට සීලයේ හෝ දස සීලයේ පිහිටා ගෙන එම දන් පින්කම් සිදු කරනු ලබනවා නම්, සීලයේ පිහිටා දෙනු ලබන දානය නොවරදවාම මහත් ඵල මහත් ආනිශංස ගෙන දෙන පින්කමක් බවට පත් වෙනවා.

දානමය පින්කම මහත් ඵල වීමට අවශ්‍ය වන ඊළඟ කරුණ නම්,
❖දානය පිළිගනු ලබන ප්‍රතිග්‍රාහක පක්ෂය සීලවන්ත වීම.
❖චිත්ත සන්තානය ප්‍රසන්න වීම.
❖කර්ම ඵල විශ්වාස කිරීමේ නුවණින් යුක්ත වීම.

මේ කරුණු අතරින් සම්පාදනය කළ යුතු කරුණු තුනයි. අපට අවශ්‍ය වන්නේ ඒ මොනවාද?
❖දාන වස්තුව ධාර්මිෂ්ඨ කර ගැනීමත්,
❖චිත්ත සන්තානය ප්‍රසන්න කර ගැනීමත්,
❖නිරන්තරයෙන් ම ඤාණ සම්ප්‍රයුක්තව එම කුසල ක්‍රියාවන්හි යෙදීමත් යන තුනයි.

වස්තුව ධාර්මිශ්ඨ වීම ගැන අමුතුවෙන් සිතන්න අවශ්‍ය නැහැ. දානපති තුමා සීලවන්ත නම් දාන වස්තුව පරම ධාර්මිෂ්ඨවයි උපයා සපයා ගනු ලබන්නේ. එබැවින් ධර්මිෂ්ඨ දාන වස්තුව එයින්ම සම්පූර්ණයි.
❖ඊළඟට සුපසන්න චිත්තතාවයත්
❖කර්ම ඵල විශ්වාස කිරීමේ නුවණත් යන දෙකයි අපට අත්‍යාවශ්‍ය වන්නේ සකස් කර ගන්නට.

චිත්ත සන්තානය සුපසන්න වීම කියන මෙම කරුණ සම්පූර්ණ වීමට කරුණු රාශියක් අවශ්‍ය වෙනවා. යම්කිසි ක්‍රමයකින් එම කරුණු වලින් එකක් හරි එකතු වෙනවා නම්, සිත සෝමනස්ස සහගත කරගන්නට හැකිවෙනවා. සිත සොම්නස් කිරීමේ කරුණු දාහතක් තිබෙනවා. අභිධර්ම ක්‍රමයට අනුව ඤාණ සම්ප්‍රයුක්ත වීමේ කරුණු දහතුනක් තිබෙනවා.

**ඉට්ඨාරම්මණ සද්ධාච**
**බාහුල්ලං දිට්ඨි සුද්ධිච**
**ඵලදස්සාවිතා චේව**
**පීති බොජ්ඣඞග හේතුයෝ**

**ඒකා දස තථා ධම්මා**
**අගම්භීරසභාවතා**
**සෝමනස්ස යුතා සන්ධි**
**ඉච්චේතේ සුබ හේතුවෝ**

මෙම සංග්‍රහ කථාවෙන් කියවෙන්නේ පින්කමක් සිදු කිරීමේදී සිත සොම්නස් වීමේ කරුණු දාහත පිළිබඳවයි.

එම කරුණු දාහත නම්,

❖ **ඉට්ඨාරම්මණතා පළමුවැන්න**

සිත පැහැදෙන පූජනීය අරමුණු ලැබීම, පූජනීය ස්ථාන දැක ගන්න ලැබීම, බුද්ධ ප්‍රතිමා දැක ගන්නට ලැබීම, දාගැබ් දැක ගන්නට ලැබීම, බෝධීන් වහන්සේලා පූජනීය මහා සංඝරත්නය, සිල්වත් ගුණවත් උතුමන් වහන්සේලා සියැසින් දැක ගන්නට ලැබීම, ඉෂ්ඨ අරමුණු, ඒ වාගේ ඉෂ්ඨ අරමුණු දැකීම තුළින් සිතේ ප්‍රබෝධයක් ඇති වෙනවා. සොම්නස් සහගත වීමට උපකාරී වෙනවා.

❖ **දෙවන අරමුණ නම්, ,සද්ධා බාහුල්ලං,**

බුද්ධ, ධම්ම, සංඝ, යන තුරුණුවන් කෙරෙහි, සිතේ ශ්‍රද්ධාව බහුල වීම දැඩි ශ්‍රද්ධාවකින් පින්කම් වල යෙදීම තුළින්, සිත සොම්නස් වෙනවා.

❖ **තුන්වන කරුණ නම් දිට්ඨ සුද්ධිච,**

තමාගේ සිතේ සම්මා දිට්ඨිය මනා කොට පිහිටා තිබීම, ''දිට්ඨි සුද්ධි'' නම් වෙනවා. කර්මය, කර්ම විපාක, හේතු, හේතු ඵල ධර්ම, මැනවින් තේරුම් ගෙන සැබෑ සම්මා දිට්ඨියේ පිහිටාගෙන,

පින්කම් වල යෙදෙන විට, තම තමාගේ සිතට බලවත් සොම්නසක් සතුටක් ඇති වෙනවා.

### ❖ ඵල දස්සාවිතා හතර වන කරුණයි.

පින්කම් කිරීමෙන් ලැබෙන ආනිශංස පිළිබඳ නැණ නුවණින් සලකා තේරුම් කරගෙන එම පින්කමෙහි යෙදීමෙන්, වඩ වඩාත් කුසල් නැවත නැවත සිදු කිරීමේ උදයෝගය සමගම සිතේ සතුටක්, සොම්නසක් ඇතිවෙනවා.

මේ ආකාරයෙන් දන් දීමෙන්, සසර ගමනේදී මේ, මේ අනුසස් ලැබෙනවා.සිල් රැකීමෙන් මේ, මේ අනුසස් ලැබෙනවා. භාවනා වැඩීමෙන් මේ, මේ අනුසස් ලැබෙනවා. මෙසේ දම් පින්කම් කිරීම තුලින් මතු අනාගතයේදී, රහත් බෝධිය ලබන්නත් හැකි වෙනවා. පසේ බුදු බව ලබන්නත් හැකි වෙනවා. තව තවත් තානාන්තර ලබන්නටත් හැකි වෙනවා. ලොව්තුරා බුදු බව ලබන්නටත් හැකි වෙනවා. සියලු සසර දුක් ගෙවා දමා ශාන්ත අමා මහ නිවන් සුව ලබන්නටත් හේතු උපනිශ්‍රය වෙනවා. මේ ආදී වශයෙන් පින්කම් සිදු කිරීමෙන් ලැබෙන ආනිශංස පිළිබඳව සිතන විටත් තව තවත් වඩ වඩාත් පින්කම් සිදු කර ගැනීම සඳහා සිතේ සතුටත් සොම්නස් බවක් ඇති වෙනවා.

### ❖ ප්‍රීතිබෝජ්ඣඞ්ග හේතයෝ ඒකාදස තථා ධම්මා.

ප්‍රීති සම් බොජ්ඣඞගය වැඩීමේ හේතු කරුණු එකොළහක් තිබෙනවා.
එම කරුණු එකොළහ නම්,

**01.** **බුද්ධානුස්සති**
**02.** **ධම්මානුස්සති**
**03.** **සංඝානුස්සති**
**04.** **සීලානුස්සති**
**05.** **චාගානුස්සති**
**06.** **දේවතානුස්සති**
**07.** **උපසමානුස්සති**

මෙම අනුස්සති හත පුරුදු කිරීමෙන් සිත සොම්නස් සහගත වෙනවා.
තවත් කරුණු හතරක් තිබෙනවා ඒවා නම්,

01.තුරුණුවන් කෙරෙහි ශ්‍රද්ධාවක් නැති පුද්ගලයන්ගෙන් වෙන්වීම.
02.තුරුණුවන් ගැන ප්‍රසාදය තිබෙන පුද්ගලයන්ම ආශ්‍රයට ගැනීම.
03.සිත පැහැදෙන බුදු බණ ඇසීම.
04.සැම විටම සොම්නස් සහගතව පින්කම් සිදු කිරීමේ අධිෂ්ඨානය.
මෙම කරුණු එකොළහ තුලින් සිතේ සතුට සොම්නස් බවක් ඇති වෙනවා.

❖ **අගම්භීරසභාවතා**

සාම්භීරත්වය අඩුවීමත් සිත සොම්නස් සහගත වීමට හේතු වන කරුණක් **අගම්භීරසභාවතා** කියන්නේ, නියත විවරණ ලබා ගත් බෝධිසත්වන් වහන්සේලාට නම් සිත ගැඹුරුයි. ගැඹුරු නිසා උන්වහන්සේලාගේ සිතේ සතුටක් සොම්නසක් ඇති වන්නේ සාම්භීර කුසල් නමින් හඳුන්වන්නේ, උන්වහන්සේලාට තමන්ගේ ඇසක් දන් දෙන්න ලැබුනා නම්, ලේ දන් දෙන්න ලැබුණා නම්, මස් දන් දෙන්න ලැබුනා නම් හිස දන් දෙන්න ලැබුනා නම් මේවාගේ ගැඹුරු පින්කම් සිදු කරන කොට උන්වහන්සේලාගේ සිත සොම්නස් වෙනවා.

ඒ හැර සාමාන්‍ය ආහාර වේලක් දීම, වෙනත් සාමාන්‍ය දෙයක් දීම උන්වමන්සේලාට එපමණ ගැඹුරක් නැහැ. එසේ නමුත් නියත විවරණ ලබා නොගත් අන් අයට ඉතාම ස්වල්ප පිංකම් පවා සිත සොම්නස් සහගත වීමට හේතු වෙනවා. සිත නොගැඹුරු බැවින් කුඩා පිංකමකදී පවා සොම්නස් සහගත වෙනවා. එයට කියන්නේ ''අගම්භීර සභාවතා''

❖ සොමනස්සස යුතා සන්ධි

සෝමනස්සස යුතා සන්ධි කියන්නේ, සොම්නස් සහගත,

ප්‍රතිසන්ධියකින් ඉපදී සිටීමයි. අපේ සිත සොම්නස් සහගත පටිසන්ධියකින් අප ඉපදී තිබුණා නම්, අප විසින් සිදු කරණු ලබන සෑම කුසලයක් ම සොම්නස්සහගත වෙනවා.

සොම්නස් සහගත සිතකින් අපි මෙලොව, මව්කුස පිළිසිඳ ගැනීම නිසයි. අද අපි වර්තමානයේ කරන සෑම කුසල ක්‍රියාවන්හිදී ම සතුටු මුහුණින්, සතුටු සිතින් යුතුව ඒ ඒ කුසල ක්‍රියාවන්හි යෙදෙන්න අවස්ථාව ලැබෙන්නේ.

බොහෝ සෙයින්ම බෞද්ධයන් අතර අද කාලයේ ජීවත් වන බොහෝ දෙනා සෝමනස්ස ප්‍රතිසන්ධියකින් උපන් අය. එයට හේතුව නම් බොහෝ දෙනා ප්‍රියමනාප මුහුණින්, සතුටු සිතින් යුතුව ඒ ඒ කුසල ක්‍රියාවන්හි යෙදෙන්න අවස්ථාව ලැබෙන්නේ.

බොහෝ සෙයින්ම බෞද්ධයන් අතර අද කාලයේ ජීවත් වන බොහෝ දෙනා සෝමනස්ස ප්‍රතිසන්ධියකින් උපන් අය. එයට හේතුව නම් බොහෝ දෙනා ප්‍රියමනාප මුහුණින්, සතුටු මුහුණින්, ප්‍රියමනාප සිතකින් යුතුවයි, තුරුණුවන් මුදුනෙන් පිළිගෙන ආගමානුකූලව දවස ගෙවන්නේ. එයින් පැහැදිළි වෙනවා බොහෝ දෙනා ඉපදී තිබෙන්නේ සෝමනස්ස සහගත කුසල විපායකින් බව. මෙතන සදහන් වුනා. සිත සොම්නස් වීමට උපකාර වන කරුණු දාහතක් මෙම කරුණු දාහතෙන් එකක් හෝ තිබෙනවා නම් ඒ කෙනා සිදු කරණු ලබන පින්කම සොම්නස් සහගතයි.

ඥාන සම්ප්‍රයුක්ත වීමට කරුණු දහතුනක් අවශ්‍ය වෙනවා. ඒ කරුණු පිළිබඳව දැනගෙන තිබීම වටිනවා. හේතුව නම් අප කරන කුසල් තුලින් වැඩි ආනිසංශයක්, වැඩි ඵලදාවක්, වැඩි අස්වැන්නක්, ලැබෙන ආකාරයට කරන්න මේවා උපකාර වෙනවා. කුඹුරක් කරන ගොවියා වැඩි අස්වැන්නක් ලබන්නයි බලාපොරොත්තු වෙන්නේ, ඒ වාගේ කුසලයක් සිදු කළාම, වැඩි අස්වැන්නක් ලැබෙන්නේ එම කුසල් සිත සමඟ යෙදෙන නුවණ ඥාන සම්ප්‍රයුක්ත බව නිසයි. කුසල් සිතේ බලගතු බව ලැබෙන්නේ, නුවණ එක්කාසුවීම නිසයි. ඥාණ සම්ප්‍රයුක්ත වීමේ කරුණු දහතුන නම්,

**කම්මූපපත්ති තෝ චේව තථා ඉන්ද්‍රිය පාකතෝ**
**කිලේසා උපසමා ධම්මා විජයස්සව හේතුයෝ**
**තතථ ධම්මේහි බුද්ධාදී ගුණානුස්සර ණේනච**
**සප්පඤ්ඤ සන්ධිතොචේව චිත්තං ඤාණ යුතං සියා**

මෙතන කරුණු දහතුනක් තිබෙනවා. අපි ඒවා තෝරා ගනිමු.

01. කම්මුපපත්තිතෝචේච : තමා කරන ලද කුසලය ඥාණය වැඩෙන කුසලයක් වීම, පහන් පූජා කිරීම, ඥාන පූජා සිදු කිරීම, බුද්ධ පූජා සිදු කිරීම, බණ කීම, බණ ඇසීම, දහම් පොත් මුද්‍රණයකරවා බෙදා දීම මේ සෑම පිංකමක්ම නුවණ වැඩෙන පිංකම්.

02. උප්පත්ති කියන්නේ : සතර අපායෙන් මිදුණු කෙනෙක් වීම, මනුෂ්‍ය දුර්භාග්‍ය කෙනෙක් නොවීම, තිරිසන්, ප්‍රේත අසුර, නරකය කියන අපායන්ගෙන් මිදී මනුලොව, දෙවුලොව, බඹලොව, උපන්න අයටයි, සිතේ ඥාන සම්පයුත්තව කුසල් සිදුකර ගන්නට හැකිවෙන්නේ, මනුෂ්‍යයන් අතර වුවත් අන්ධ, ගොළු, බිහිරි, උම්මත්තක, මන්ධබුද්ධික, තත්වයෙන් මිදී සිටින්න ඕනෑ. මෙයට කියන්නේ සුගති ලෝකයක ඉපදී සිටීම දෙවන කරුණයි.

03. ඉන්ද්‍රිය පාකතෝ : කුඩා ළදරුවකු හට වගේ නොවෙයි වැඩිහිටි තත්වයට පැමිණියම, ඉන්ද්‍රියන් පිළිබඳව හොදට අවබෝධයක් තිබෙනවා. හොදට පෙනෙනවා, හොදට ඇසෙනවා, හොදට කතාකරන්න හැකි වෙනවා. මනසේ ඉන්ද්‍රියන් දියුණු වූ වැඩුනා වූ, වැඩිහිටි කෙනෙක් කරන කුසලය නැණ නුවණින් යුක්තව ඉතා සාර්ථකව කරන්නට හැකිවෙනවා. ඒත් කුඩා දරුවකු හට පිංකමක් කිරීමේදී ඔහුගේ ඉන්ද්‍රයන් මනාව මුහුකරුවා නොගොස් ඇති බැවින් ඤාණ වන්තව එම පිංකම් සිදුකළ නොහැකි වෙනවා.

04. කිලේසූපසමාඃ දන්දීල, සිල් රැකලා, බණ අහලා,

භාවනා වඩලා මේ වගේ ආගමික පින්කම් තුළින් තමන්ගේ සිත කෙලෙස් තුනී කරගෙන තිබීමයි කිලේසූපමා කියන්නේ, ඒවාගේ කෙලෙස් තුනී කරගෙන තිබෙන කෙනෙකු කරන කුසලය ඤාණ සම්ප්‍රයුක්ත වෙනවා.

දැන් කරුණු හතරක් සදහන් වුනා. ඒවා නම්,

**ඥානය වැඩෙන කුසලයක් වීම.**
**සුගති ලෝකයක ඉපදී සිටින්නෙකු වීම.**
**ඉන්ද්‍රියන් මුහුකුරුවා ගිය කෙනෙක් වීම.**
**කෙලෙසුන් සන්සිඳුවාගෙන සිටින්නෙක් වීම.**

ඊළගට තවත් තිබෙනවා ධම්ම විජය බොජ්ඣඞගය වැඩෙන කරුණු හතක්. එම කරුණු හතෙන් එකක් හෝ යෙදුනා නම් එය පිංකමක් වෙනවා.
එම කරුණු හත නම්,

**1. පරිපුච්ඡකතා**
**2. වස්තු විසද කිරියතා**
**3. ඉන්ද්‍රිය සමත්ත පටිපාදනතා**
**4. දුප්පඤ්ඤ පුග්ගල පරිවජ්ජනතා**
**5. පඤ්ඤවන්ත පුග්ගල සේවනතා**
**6. ගම්භීර ඤාණ චරියා පච්ච වෙක්ඛණතා**
**7. තදධිමුත්තතා**

**පරිපුච්ඡකතා**

බුදු බණ අසා දැන ගැනීම, බුදු බණ පිළබඳව සැක සංකා ඇති තැන් නිවැරදි කර ගැනීම ''පරිපුච්ඡකතා'' නම් වෙනවා. එවැනි කෙනෙකු හටයි කරනු ලබන පිංකම ඤාණ සම්පයුක්තව කරන්නට ලැබෙන්නේ. එයට හේතුව නම් එතුමා ධර්මය ගැන මනා අවබෝධයකින් යුතුව එයින් ලැබෙන ආනිසංස ඵලය ගැන පවා මනා අවබෝධයකින් යුතුව පිංකම් කරන බැවින් එම පිංකම

ඥාණවන්තවම සිදු කළා වෙනවා.

## වස්තුවිසද කිරියතා

කියන්නේ තමන්ගේ සන්තානය පිරිසිදුව තබාගෙන පින්කම්වල යෙදීම, දත් මැදීම, මූණ සේදීම, හිස, පීරල ස්නානය කරල, නියපොතු බාල, කැසිකිලි වැසිකිලි ආදී කටයුතු ආදියෙන් නිදහස් වී දෙපය දොවාගෙන, දෑත දොවාගෙන, පිරිසිදු දැතින්, පිරිසිදු ශරීරයෙන් පිරිසිදු මුහුණින් පිරිසිදු ඇඳුමින් සැරසීගෙන දාන, ශීල, භාවනාදී පංකම් වල යෙදෙනවා නම් එම පිංකම ඉතාම සාර්ථකව ඥාණවන්තවම සිදු කළ හැකි වෙනවා.

අපේ පැරණි බෞද්ධයෝ පිංකමක් කරන්නට මත්තෙන් සේනාසනයකට ඇතුල් වෙන්නට පෙර පිරිසිදු වෙලා, නාලා, පිරුවට ඇඳගන්නවා. සුදු ඇඳගෙන තමයි ඉස්සර කාලයේ බෞද්ධයෝ පූජනීය තැනකට පියනගන්නේ එය වැදගත් චාරිත්‍රයක් හැම දෙනාම සේනාසනයකට විහාරයකට පිවිසෙන්නේ, සුදු වතින් සැරසීගෙනයි. සුදු උතුරු සලුවක් පොරවාගෙන පැමිණීම අපේ පුරාණ බෞද්ධයන්ගේ සිරිතක්. අද කාලයේදී නම් ඒක බොහෝ සෙයින් අමතකවීගෙන යනවා. බොහෝ සෙයින්ම ඒ වාගේ නැතිව හැසිරෙනවා. එසේ නැතිව සුදුවතක් දරා ගැනීම බෞද්ධ ශිෂ්ඨාචාරයටත් ඉතාම ගැලපෙනවා.

ඒ වාගේ කයින් පිරිසිදු වීමත් අවට පවිත්‍රතාවය ඇති කර ගැනීම එනම්, මලු පෙත් මං ඇමදල, පැන් පෙරලා තබලා, අනිකුත් වත් පිළිවෙත් සියල්ල නිම කරලා, පිරිසිදුවට තිබෙනවා නම් වටපිටාවත් පවිත්‍රයි. එසේ නොමැතිව ශරීරයත් අපිරිසිදුව තබාගෙන මලු පෙත්මන් ආදිය පිරිසිදු නොකර කැළිකසල සහිතව පහන් මල් බදුන් ආදිය පිරිසිදු නොකර කැළිකසල සහිතව යම් පිංකමක් සිදු කිරීමේදී එම පිංකම ඥාණ සම්පයුක්තව සිදු කළ නොහැකි වෙනවා. එබැවින් තමාගේ ශරීරයත් බාහිර වශයෙන් බෝ මළු, සෑ මළු, සේනාසන ආදිය පවිත්‍රකර පූජා භාණ්ඩ මල් පහන් උපකරණ ආදිය ඉතාම පිරිසදුව සෝදලා, පිරිසිදු කරලා යම් කිසි පිංකමක් කරනවා නම්, එම පිංකම නැණ නුවණින් සලකා බලා සිදු කළ බැවින් මහත් ඵල අනුසස් ගෙනදෙන, පිංකමක් බවට

පත් වෙනවා.

**ඉන්ද්‍රිය සමන්ත පටිපාදනතා**

අපේ අධ්‍යාත්මික සන්තානයේ ඉන්ද්‍රිය ධර්ම පහක් තිබෙනවා. ඒවා නම්,

**1. සද්ධා ඉන්ද්‍රිය**
**2. වීරිය ඉන්ද්‍රිය**
**3. සති ඉන්ද්‍රිය**
**4. සමාධි ඉන්ද්‍රිය**
**5. ප්‍රඥා ඉන්ද්‍රිය**

මෙම ඉන්ද්‍රිය ධර්ම 5 සම සමව තබා ගන්නට ඕනෑ. එයින් ''සතිය'' නැමැති ස්මෘතිය වැඩියෙන් තිබෙන්නට ඕනෑ. ශ්‍රද්ධාව හා ප්‍රඥාව යන දෙක සම සමව තිබෙන්නට ඕනෑ. වීර්‍ය්‍යය සහ සමාධිය යන දෙක සම සමව තිබෙන්නට ඕනෑ. මේවාගෙන් එකක් හෝ අඩු නම් එතනදී කුසල් සිත ඥාණ සම්ප්‍රයුක්ත වන්නේ නැහැ. එතැනදී කුසල් සිත දුර්වල සිතක් බවට පත්වෙනවා. එබැවින් මෙම ධර්මතා පහ අඩු වැඩි නැතිව සතිය වැඩියෙන් තබාගෙන සෙසු ශ්‍රද්ධා - විරිය - සමාධි - ප්‍රඥා යන ධර්ම හතරම අඩු වැඩි නොවී සම සමව පවත්වා ගන්නට ඕනෑ.

එබඳු කෙනෙක් යම්කිසි පිංකමක් සිදු කිරීමේදී සිත ඥාණ සම්ප්‍රයුක්ත වෙනවා.

**දුප්පඤ්ඤපුග්ගල පරිවජ්ජනතා**

කියන්නේ බුදු බණ නොදන්න අය, අනුවණ අය, දුෂ්ප්‍රාඥ අය පස්පව් දස අකුසල් කරන අය ආශ්‍රයට ගැනීමෙන් වැලකී සිටීමයි. එබඳු පුද්ගලයන් ආශ්‍රය නොකිරීම නිසා නුවණ වැඩෙනවා.

**පඤ්ඤවන්ත පුග්ගල සේවනතා**

කියන්නේ බුදු බණ දන්නා ඥාණවන්ත කළ්‍යාණ මිත්‍ර සත් පුරුෂයන් ආශ්‍රය කිරීම නිතර ධර්ම සාකච්ඡා කිරීම, නොදන්නා දෙය අසා දැන ගැනීම, ඒවා ආදර්ශයට ගෙන ක්‍රියාත්මක කිරීම තුලින් තමාගේ සිතේ නුවණ වර්ධනය වෙනවා.

**ගාම්භිර ඤාණචරියා පච්චවෙක්ඛනතා**

කියන්නේ මහා බෝධි සත්වයන් වහන්සේ විසින් ප්‍රඥා පාරමී පිරූ ජීවිත තිබෙනවා නේද? සේනක පණ්ඩිත ජාතකය, ආදාශමුඛ පණ්ඩිත ජාතකය, විදුර පණ්ඩිත ජාතකය, උම්මග්ග ජාතකය, වැනි මෙබඳු බෝධි

සත්ත්ව චරිත ගැන සිහි කිරීමත්, බුදු බවට පත්වී දේශනා කළ, ස්කන්ධ දේශනා ආයතන දේශනා, ධාතු දේශනා චතුරාර්‍ය සත්‍ය දේශනා, පටිච්ච සමුප්පාද දේශනා ආදී සාම්භීර ධර්මයන් නිතර නිතර කියනවා නම්, ඒ පිළිබඳ ආවර්ජනය කරනවා නම්, ඒවා මෙනෙහි කරනවා නම් එයින්ද තමා කරන කුසලය ඥාණ සම්ප්‍රයුක්ත වෙනවා. එවැනි කවර කෙනෙක් විසින් නමුත් කෙබඳු පින්කමක් කරතත් එය ඥාණ සම්ප්‍රයුක්ත වෙනවා.

**තදධිමුත්තතා**

කියන්නේ මෙම හැම කුසල් සිතක්ම ඤාණවන්තවම සිදු කරන්නේමයි කියලා දැඩි ලෙස සිතේ අධිෂ්ඨානයක් තබාගෙන කටයුතු කිරීමයි. එසේ අධිෂ්ඨාන බල පිහිටුවාගෙන පිංකම සිදු කිරීමේදී, එම පිංකම මුල සිට අග දක්වාම, දිගින් දිගටම ඤාණය මුසු කරගෙන සිදු කරන බැවින්, එම කුසලය සාර්ථකවූ ම, මහත් ඵල ගෙන දෙන පිංකමක් බවට පත්වෙනවා.

**බුද්ධාදී ගුණානුස්සරණේනච**

කියන්නේ ඉතිපිසෝ ගාථා පාඨයේ තිබෙන ගුණ මෙනෙහි කරමින්, ඉතිපිසෝ ගාථාව භාවනාවක් මෙන් නිතිපතා වඩනාවානම්, තමා කරනු ලබන කුසලය ඤාන සම්ප්‍රයුක්ත වෙනවා. දානමය පිංකමක් කිරීමේදී බුදුගුණ සිත සිතා බඳු ගුණ කියව කියවා, කිරීමේදී දහම් ගුණ මෙනෙහි කරමින් එම දම් පිංකම් කරනකොට, එම පිංකම් ඤාන සම්ප්‍රයුක්ත පිංකම් බවට පත්වෙනවා.

**සප්පඤ්ඤා සන්ධි**

කියන්නේ උපතින්ම ඤාණ සම්ප්‍රයුක්තව, ප්‍රතිසන්ධියකින් ඉපදී සිටින්නට ඕනෑ. ත්‍රිහේතුක ප්‍රතිසන්ධියකින් ඉපදී සිටින

කෙනෙකුට, තමා කරනු ලබන සෑම කුසලයක්ම, ඥාණවන්තවම කරගන්නට හැකි වෙනවා.

කුසලයක් ඥාණසම්ප්‍රයුක්ත වීමට උපකාරවන කරුණු දහතුනක් මෙතන සදහන් වුනා. මෙම ධර්මතා අනුව අප විසින් ඥාණ සම්පයුක්තව දානයක් දෙනවා නම්, නුවණින් යුක්තව සීලයක් රකින විට, නැණ නුවණින් යුතුව භාවනා වඩනාවනම්, ඥාණ සම්ප්‍රයුක්තව ආගමික වත් පිළිවෙත්

වල යෙදීමේදී, දවසෙන් දවස, අපේ සිත්වල උත්කෘෂ්ඨ කුසල් වර්ධනය වන බැවින්, අප මෙලොව වශයෙන් සිතූ පැතූ අර්ථයන් සිදු වෙනවා. පරලොව වශයෙන් සුගතිගාමී වෙනවා. ජාති ජාතිත් ආලෝකයෙන් ආලෝකයට යා ගන්නට සමත් වෙනවා. අවසානයේදී භව තරණය කිරීමෙන් ලැබෙන, ලෝකෝත්තර නිවන් සුව ක්‍ෂාක්සාත් කර ගැනීමට හේතු වාසනා වෙනවා. යම්කිසි පින්කමක් කිරීමේදී සිත සොම්නස් සහගත වීමටත්, ඥාණ සම්ප්‍රයුක්ත වීමටත්, හේතුවන කරුණු රාශියක් මෙතන සඟහන් වුණා. ඒ අතරින් ඉතාම වැදගත් කරුණක් පිළිබඳව අපි විශේෂයෙන් තේරුම්ගත යුතු වෙනවා.

යම්කිසි දානයක් දෙන වෙලාවේ එම දානය මහත්ඵල මහානිසංස වන්නේ යොදන ඥාණ සම්ප්‍රයුක්ත බව නිසයි. එය පිළිබඳව වඩාත් අවබෝධය පහසුවනු පිණිස අට්ඨ කථාචායර්යීන් වහන්සේලා විසින්, දක්ඛිණ විභඬග සූත්‍ර අට්ඨ කතාවේ බොහෝ වටිනා ප්‍රශ්නයක් අහල තිබෙනවා.
එම ප්‍රශ්නය මෙහෙමයි.

යම් දවසක සැරියුත් මුගලන් මහ රහතන් වහන්සේ විසින් ලොව්තුරා බුදුරජාණන් වහන්සේට දානයක් පූජා කරනවා නම් එම දානය ද මහත් ඵල වන්නේ?

එසේ නොමැතිව ලොව්තුරා බුදුරජාණන් වහන්සේ විසින් සැරියුත් මහරහතන් වහන්සේට පිරිනමනවා නම් එම දානය ද මහත් ඵල වන්නේ? මෙම දාන දෙකෙන් කවර දානය ද වැඩි ආනිශංස ලැබෙන්නේ? යනුවෙන් ප්‍රශ්න කර තිබෙනවා. ඉතාමත්

වැදගත් ගැඹුරු ප්‍රශ්නයක් නේද? මෙම ප්‍රශ්නය අනුසාරයෙන් සලකා බැලීමේදී බොහෝ දෙනා කියන්නේ, පිළිතුරු දෙන්නේ සැරියුත් ස්වාමීන් වහන්සේ විසින් බුදුරජාණන් වහන්සේට දෙන දානය මහත් ඵලයි මහානිශංසයි කියලයි.

ඒත් එම පිළිතුර ප්‍රතික්ෂේප කරන අට්ඨ කථාචායයීයන් වහන්සේලා එම ප්‍රශ්නය විසඳන්නේ එහි අනිත් පැත්තටයි. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ විසින් සැරියුත් මහ රහතන් වහන්සේට දෙන දානය මහත් ඵලයි මහානිශංසයි. ඒ තමා නිවැරදි පිළිතුර.

එයට හේතුව නම් සැරියුත් මහරහතන් වහන්සේ විසින් බුදුරජාණන් වහන්සේට දානයක් දෙන වේලාවේදී යම් පමණක්ද ප්‍රඥාව පහළ වන්නේ? ලොව්තුරා බුදුරජාණන් වහන්සේ විසින් සැරියුත් මහ රහතන් වහන්සේට දානයක් පිරිනමන වේලාවේදී උන් වහන්සේ සන්තානයේ ඊට වඩා සිය ගුණයෙන්, දහස් ගුණයෙන්, ලක්ෂ කෝටි ගුණයෙන්, අසංඛ්‍ය ගුණයෙන්, ප්‍රඥාව පහළ වෙනවා. උන් වහන්සේ විසින් යමක් පරිත්‍යාග කරන්නේ, අසාමාන්‍ය ප්‍රඥාවෙන් බැවින් සැරියුත් මහා රහතන් වහන්සේ විසින් දෙන දානයට වැඩිය ලොව්තුරා බුදුරජාණන් වහන්සේ විසින් දෙනු ලබන දානය මහත් ඵලයි මහානිශංසයි.

මෙම ධර්ම කරුණු අපි මැනවින් අවබෝධ කරගෙන සෑම පිංකමකදීම විශේෂයෙන් අවධි කරගන්නට අවශ්‍ය වෙනවා ප්‍රඥා ඉන්ද්‍රිය ඥාණ සම්ප්‍රයුක්ත බව සඳහා අපට ගතයුතු අරමුණු රාශියක් තිබෙනවා. ඒවා නම්, බෝධි සත්ත්වයන් වහන්සේ දාන පාරමී පිරූ ආත්ම භාවයන් සිහියට  නගා ගැනීම, අප මහා බෝධි සත්ත්වයන් වහන්සේ විසින් දාන පාරමිතාවන් පිරූ ආත්ම භාවයන් පිළිබඳ සිහි කර කර, සිහි කර කර, පිංකම් වල යෙදෙන විට එම පිංකම අතිශයින්ම ඥාණ සම්ප්‍රයුක්ත පිංකමක් බවට පත් වෙනවා.

තමා විසින් තමා කරන පිංකම් භාවනාවට හරවන්නට පුළුවන්. බුද්ධානුස්සතියට හරවන්නටත් හැකි වෙනවා. ධම්මානුස්සතියට, සංඝානුස්සතියට හරවන්නටත් හැකි වෙනවා.

පිංකම සිව්බඹ විහරණයට හරවන්නටත් පුළුවන්. තමා කරන පිංකම සීලානුස්සතියට, උපසමානුස්සතියට හරවන්නටත් හැකි වෙනවා.

ඊටත් වඩා භාවනායෝගී පිරිසකට විශේෂයෙන්ම නාම රූප ස්කන්ධ, ආයතන ආදී වශයෙන් බැලීම වැදගත් වෙනවා. යම් කෙනෙක් විසින් මහා සංඝයාට පිණ්ඩපාත දානයක් පූජා කරනවා චීවර සේනාසන ආදිය පූජා කරනවා කියලා අපි සිතමු.

එම පූජාව තුළ මොනවාද තිබෙන්නේ?

රූප කලාප අටක් පමණයි. මේ පූජා නොයෙක් නම් වලින් හඳුන්වනවා. ඒත් ඒ වස්තු ඇතුළේ තිබෙන්නේ රූප කලාප අටක් පමණයි.   ඒවා නම්,

පඨවි - ආපෝ - තේජෝ - වයෝ - වර්ණ - ගන්ධ - රස - ඕජා

මෙම සුද්ධාෂ්ඨක සමූහයයි චීවර නාමයෙන් හඳුන්වන්නේ, පිණ්ඩපාතය, සේනාසන, ගිලන් පස නමින් හඳුන්වනු ලබන්නේ, අපේ ඇඳුම් පැළඳුම් වල තිබෙන්නේ, වාඩිවෙන ආසනවල තිබෙන්නේ, ගෙවල්වල තිබෙන්නේ, වහලවල් වල තිබෙන්නේ, හැම දේකම තිබෙන්නේ සුද්ධාෂ්ඨක සමූහයක්. එම සුද්ධාෂ්ඨක සමූහය අපි හරවා බැලිය යුතු වෙනවා. මෙම දාන වස්තුව සමඟ කෙසේද? මෙම දාන වස්තුවෙ තිබෙන "තද ලක්ෂණ" පඨවි ධාතුව රූප ස්කන්ධයකි, පොට්ඨබ්බායතනයකි, පොට්ඨබ්බ ධාතුවකි, දුක්ඛ සත්‍යයකි, මෙම දාන වස්තුවේ තිබෙන ආබන්ධන ලක්ෂණය ආපෝ ධාතුව, රූප ස්කන්ධයකි, රූපායතනයකි, ධර්ම ධාතුවකි, දුක්ඛ සත්‍යයකි.

මෙම පූජා වස්තුවේ තිබෙන උණ හත්ත ලක්ෂණය, තේජෝ ධාතුව රූප ස්කන්ධයකි. පොට්ඨබ්බායතනයකි. පොට්ඨබ්බ ධාතුවකි, දුක්ඛ සත්‍යයකි.

මෙම පූජා වස්තුවේ තිබෙන උණ හත්ත ලක්ෂණය, තේජෝ ධාතුව රූප ස්කන්ධයකි, පොට්ඨබ්බායතනයකි.

පොට්ඨබ්බ ධාතුවකි, දුක්ඛ සත්‍යයකි., මෙම පූජා වස්තුවේ තිබෙන විෂ්කම්භන ලක්ෂණය, වායෝ ධාතුව, රූප ස්කන්ධයකි, පොට්ඨබ්බ ආයතනයකි, පොට්ඨබ්බ ධාතුවකි, දුක්ඛ සත්‍යයකි. ඇසට ලක්වන සුළු වර්ණ රූපය, රූප ස්කන්ධයකි, රූපායතනයකි, රූප ධාතුවකි, දුක්ඛ සත්‍යයකි, ඝාණයට ලක්වන ගන්ධ රූපය, රූප ස්කන්ධයකි, ගන්ධ ආයතනයකි, ගන්ධ ධාතුවකි, දුක්ඛ සත්‍යයකි. දිවට ලක්වන රස රූපය, රූප ස්කන්ධයකි, රස ආයතනයකි, රස ධාතුවකි, දුක්ඛ සත්‍යයකි, රූප උපදවන ඕජා රූපය, රූප ස්කන්ධයකි, රූපායතනයකි, ධර්ම ධාතුවකි, දුක්ඛ සත්‍යයකි, ශබ්ද අරමුණු දන ගන්නා ප්‍රසාදය, සෝතප්‍රසාදයකි, ගන්ධ අරමුණු දනගන්නා ප්‍රසාදය, ඝාන ප්‍රසාදයයි,

මහත්ඵල ලැබීමට නම් මෙසේ දන් පිංකම් කළ යුතුය.

රස අරමුණු දන ගන්නා ප්‍රසාදය ජිව්හා ප්‍රසාදයයි, සීතල උණුසුම පිළිබඳව ස්පර්ශ අරමුණු දනගන්නා ප්‍රසාදය, කාය ප්‍රසාදයයි. මේ තමයි ප්‍රසාද රූප පහ.

ඇසට ලක්වන වර්ණ රූපය වර්ණයයි. සෝතයට ලක්වන ශබ්ද රූපය, ශබ්දයයි. ඝාණයට ලක්වන ගන්ධය, ගන්ධ රූපයයි. දිවට ලක්වන රසය රස රූපයයි. සියල්ල විෂය රූප හතරයි. මේ ස්ත්‍රිය, මේ පුරුෂයා කියා වෙන්කොට ගත හැකි විදර්ශක භාවය, ස්ත්‍රී භාව රූපයයි, පුරුෂ භාව රූපයයි. මනෝ ධාතු මනෝ විඤ්ඤාණ ධාතුන්ට නිශ්‍රය වන වස්තු රූපය, හෘදය වස්තු රූපයයි. කර්මජ රූප කලාපයක් පාසා රූප ජීවත් වන සුළු ඉන්ද්‍රිය ජීවිතීන්ද්‍රියයි. නැවත නැවත රූප කලාප ඉපදීමේ සමර්ථ වූ ඕජා රූපය ආහාර රූපයයි. රූප කලාපයන්ගේ වෙන් කරවන සුළු අවකාශය, පරිච්ඡේද රූපයයි. කයෙන් හඟවන්නා වූ රූපය කාය විඤ්ඤත්තියයි.

වචනයෙන් හගවන්නා වූ රූපය වචී විඤ්ඤත්ති රූපයයි. රූප කලාපයන්ගේ සැහැල්ලු බව දක්වන්නේ ලහුතා රූපයයි. රූප කලාපයන්ගේ මෘදු බව දක්වන්නේ මුදුතා රූපයයි. රූප කලාපයන්ගේ පළමුවන හට ගැන්ම උපචය රූපයයි. රූප කලාපයන්ගේ පරම්පරා පැවැත්වීම සන්තති රූපයයි. රූප කලාපයන්ගේ ධීතියට පත්වීම ජරතා රූපයයි. රූප කලාපයන්ගේ

හංගක්ෂණය අනිත්‍යතා රූපයයි. මේ තමයි රූප විසි අට.

මෙම අධ්‍යාත්මික සන්තාන වල මෙසේ රූප විසි අටක් තිබෙන අතර, රූප කලාප වශයෙන් විසි එකක් තිබෙනවා. කර්මජ කලාප නවයයි. චිත්තජ කලාප හයයි. ඍතුජ කලාප හතරයි. ආහාරජ කලාප දෙකයි. සියල්ල විසි එකයි. මෙම කර්මජ - චිත්තජ - ඍතුජ - ආහාරජ යන චතු සමුට්ඨානා වූ අධ්‍යාත්මික රූපත් බාහිර වශයෙන් තිබෙන සුද්ධාෂ්ඨක රූපත් සියල්ල සම්පිණ්ඩනය කරලා අරගෙන භාවනාවට හරවනවා. අතීතවූ ද, අනාගතවූ ද, වර්තමානවූ ද, අධ්‍යාත්මිකවූ ද, බාහිරවූ ද මෙම සියලුම රූප කලාපයන් ඇතිව නැතිව යන බැවින් අනිත්‍යයි. **"අනිච්චං, සංඛතං"** හේතු ප්‍රත්‍යන්ගෙන් හට ගන්නා බැවින් සංඛතයි, **පටිච්ච සමුප්පන්නං** එක එක හේතුන්ගෙන් හට ගෙන උපදින බැවින් **පටිච්ච සමුප්පන්නයි,**

ඛය ධම්මං චිත්තක්ෂණයෙන් චිත්තක්ෂණයට වැය වේවි යන බැවින් අනිත්‍යයි. දුක්ඛං භයට්ඨෙන භයට හේතු වන බැවින් දුකයි අනත්තතා අසාර තට්ඨෙන අසාර බැවින් අනාත්මයි. නේතං මම මෙම සියළුම රූප මගේ කියා ගත නොහැකි බැවින් නේසෝ හමස්මි මෙම රූප සියල්ල මම වෙමියි කියා ගැනීමට සුදුස්සෙක් මෙහි නැත.

මෙම ආකාරයට එක එක රූප කොට්ඨාශ අරගෙන බලනව, ඊළඟට වේදනා කය, සඤ්ඤා කය, සංස්කාර කය, විඤ්ඤාණ කය, සියල්ලම බෙද බෙදා බලනවා. ඉන්පසුව ඒ සියල්ලම හරවනවා නාම රූප, ස්කන්ධ, ආයතන, ධාතු, පටිච්ච සමුප්පාද සියල්ලම පීලණ, සංඛත, සංතාප, විපරිනාම ස්වභාවයෙන් යුක්ත වන බැවින්, දුක්ඛ ආර්‍ය්‍ය සත්‍යයයි! එම දුකට ඇළුම් කරන අතීත, අනාගත, වර්තමාන, තුන් කාලයට අයත් තෘෂ්ණාව, ආයුහණ, නිධාන, සංයෝග, පළිබෝධාර්ථයෙන් යුක්ත වන බැවින් දුක්ඛ සමුදය ආර්‍ය්‍ය සත්‍යයයි!

එම දුකත් සමුදයත් නැති ශාන්ත නිර්වාණ ධාතුව නිස්සරණ, විවේක, අසංඛත, අමතාර්ථයෙන් සමන්වාගත වන බැවින් දුක්ඛ නිරෝධාර්‍ය්‍ය සත්‍යයයි!

එම දුක්ඛ නිරෝධායර්‍ය සත්‍යය අවබෝධ කර ගැනීමට වැඩිය යුතු දාන, ශීල, භාවනා වශයෙන් නැවත නැවත වැඩිය යුතු, ආයර්‍ය අෂ්ඨාංගික මාර්ගය, නියාණ, හේතු දස්සන ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්වාගතවන බැවින්, දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදා ආයර්‍ය සත්‍යය නම් වෙනවා!

මගේ මෙම දානය, මගේ මෙම ශීලය, මාගේ මේ භාවනාව මාගේ මේ සියළුම කුසල සම්භාර ධර්මය මෙම උතුම් චතුරායර්‍ය සත්‍ය ධර්මයන් එකම ආසනයකදී සතර මග නැණින් සුවසේම අවබෝධ කරගැනීම පිණිසම හේතු වේවා! වාසනා වේවා! මේ ආකාරයට දාන වස්තුන්ගේ පටන් සියළුම පංචස්කන්ධයම, සියළුම ලෝක ධාතුවම සම්පිණ්ඩනය කරමින් විපස්සනා වශයෙන් මෙනෙහි කළ හැකි වෙනවා. එහෙම නම් එම කුසලය ඒකාන්තයෙන්ම මහත් ආනුභාව සම්පන්න ඤාණ සම්ප්‍රයුක්ත කුසලයක් බවට පැමිණෙනවා.

බුදුරජාණන් වහන්සේ විසින් "වේලාම" සූත්‍රයේදී දේශනා කොට වදාළ "වේලාම නම්" මහා පුණ්‍යවන්ත බ්‍රාහ්මණතුමා අවුරුදු දොළහක් මුළුල්ලේ මහා පුදුමාකාර දානයක් දුන්නා. එම දානයේ පින එක පැත්තකින් තබා බුදු සසුනේ තිසරණ ගත එක කෙනෙකු හට දෙන දානය මහත් ඵලයි. ඒ ආකාරයට ඉහළට ඉහළට ගුණවතුන්ට දෙන දානය මහත්ඵලයි. අන්තිමට බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට දෙන දානයට වඩා මහා සංඝරත්නය උදෙසා ආවාසයක් පූජා කිරීම මහත්ඵලයි, ආවාස පූජාවටත් වැඩිය තිසරණ සමාදම්වීම මහත් ඵලයි.

ඊටත් වඩා තිසරණ පංච ශීලය සමාදම් වීම මහත් ඵලයි. තිසරණ පංච ශීලයටත් වඩා සුවඳක් ආඝ්‍රාණය කරන තරම්, කිරි පියරක් දොවන තරම්, කෙටි වේලාවක් සියළු සත්ත්වයෝ සුවපත් වෙත්වා! කියා මෙත් වැඩීම මහත් ඵලයි. ඒ සියළුම පින්කම්වලටත් වඩා, අසුරු සැණක් ගහණ කෙටි කාලයක සංස්කාරයන්ගේ යථා තත්ත්වය, අවබෝධ කරගනු පිණිස විදර්ශනා වශයෙන් මෙනෙහි කිරීම මහත් ඵලයි, මහානිසංසයි කියා ලොව්තුරා සම්මාසම්බුදු

රජාණන් වහන්සේ දේශනා කළා. එබැවින් පින්කමක් මහත් ඵල, මහානිසංස කර ගැනීමට අවශ්‍ය වන කරුණු අතරින්,

දානපතිතුමා ශීලයක පිහිටීම.
දානය පිළිගනු ලබන ප්‍රතිග්‍රාහක පක්ෂය සිල්වත් වීම.
දාන වස්තු දැහැමින් උපයා ගත් දෙයක් වීම.
සිත සුපසන්න වීම.
කර්ම ඵල විශ්වාස කිරීමේ නුවණ තිබීම.

යන මෙම කරුණු පහ යම් අවස්ථාවක සම්පූර්ණ වුනානම් එම දානමය පිංකම උදාර අනුසස් ගෙන දෙන මහානිශංස වූ, පිංකමක් බවට පත් වෙනවා.

එබැවින් දානාදී පිංකම් සිදුකිරීමේදී එම පිංකම සෝමනස්ස සහගතවම,ඥාණ සම්ප්‍රයුක්තවම, මහත් ඵල මහත් ආනිශංස ගෙන දෙන පිංකමක් බවට පමුණුවා ගනිමින් පිංකම් සිදු කර ගැනීමටත් භවයක් පාසාම දානාදී පාරමී ධර්මයන් මුදුන් පමුණුවාගෙන තම තමා විසින් පතන අධිගම බෝධි ඥානයන්ගෙන්,බුදු පසේ බුදු මහා රහතන්

වහන්සේලා............. නිවී සැනසී පැමිණ වදාළ අජරාමර ශාන්ත ලෝකෝත්තර අමා මහ නිවන් සුව අවබෝධ කර ගැනීමට හේතු වේවා! වාසනා වේවා! කියා ප්‍රාර්ථනා කරමු.

එදා දවසේදී සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් මෙම දක්ඛිණ විභඞග සූත්‍රය දේශනා කළ අතර, සුළුමෑණියන් වූ මහා ප්‍රජාපතී ගෝතමීන් වහන්සේ විසින් සම්මා සම්බුදුරජාණන් වහන්සේට පූජා කිරීම සඳහා සකස් කරගෙන පැමිණි එම චීවරය පුද්ගලිකව බුදුරජාණන් වහන්සේට පූජා කිරීමේ පිනට වඩා බුද්ධ ප්‍රමුඛ මහා සංඝයා හට පූජා කිරීමේ පින මහත් ඵල වන බව මැනවින් තේරුම් ගත් එතුමිය එම චීවරය සඟ සතු කොට පූජා කළා. මෙම සූත්‍රයේ සඳහන් පරිදි අපිටත් දානමය පින්කම් සිදු කිරීමේදී, කුසල් මහත් ඵල මහානිසංස වනසේ එම පින්කම් සිදුකර ගැනීමට ලැබේවා කියා ප්‍රාර්ථනා කරමු.

සීලයක පිහිටා මෙතෙක් වේලා සමාධිගතව ධර්‍ම ශ්‍රවණය කිරීමේ කුසලානුභාව බලයෙන් සහ රත්නත්‍රයේ සූවිසි මහාගුණානුභාව බලයෙන් සැමට මෙලොව වශයෙන් ආයුරාරෝග්‍යාදී සම්පත් අභිවර්ධනය වේවා! සකලාන්තරාය සර්වෝපද්‍රවයන් හිරු දුටු අඳුර සේ දුරු වේවා! සෙත ශාන්තිය යහපත සැලසේවා! මෙම බුදු සසුනෙහි සියවස් කලක් උදාර ලෙස පාරමී කුසල් දියුණු කිරීමේ ශක්තිය සැමට ලැබේවා! සමාධි සිතින් සැපසේ නින්දයාවා! සැපසේ අවදි වේවා! නපුරු සිහින නොපෙනේවා! දෙවියන්ට මනුෂ්‍යයන්ට සැම සත්ත්වයන්ටම ප්‍රිය වේවා! දෙවියන්ගේ දැහැමි ආරක්ෂාව නිරතුරු ලැබේවා! රජ, සොර, සතුරු, ගිනි, ජල, වස, විෂ, අවි, ආයුධා දී විපත් වළකීවා!

ගුණ නුවණින්, ධන ධාන්‍යයෙන්, යස ඉසුරින්, භව භෝග සම්පත්තීන්ගෙන් ද, දාන, සීල, භාවනා, සීල සමාධි, ප්‍රඥා ආදී උතුම් ගුණධර්‍මයන්ගෙන් ද, ජීවිත ආලෝකමත් වේවා!

සසර ගමනේදී පවා පුණ්‍යවන්ත, භාග්‍යවන්ත, බෝධි සත්ත්ව ජීවිතම උදා පත් වෙත්වා! සසර වසන තුරු බුද්ධාදී සත් පුරුෂෝත්තමයන්ගේ

සංසේවනය ලැබේවා. යෝනිසෝමනසිකාරම ධර්‍මානු ධර්‍ම ප්‍රතිපත්තිය පුරාගැනීමේ භාග්‍යය සැලසේවා! ජාතිස්මරණ ඥාණ ත්‍රිහේතුක ප්‍රතිසන්ධි සම්මාදිට්ඨිය ඇති ආනුභාව සම්පන්න ජීවිත ලබමින් පාරමී පුරා මෙලොව ජයගෙන,පරලොව ජයගෙන,සසර ජයගෙන,කෙළෙසුන් ජයගෙන, ආත්ම භාවය ජයගෙන,අනන්ත බුදුපසේ බුදු මහාරහතන් වහන්සේලා නිවී සැනසී පැමිණ වදාළවූ අජරාමර ශාන්ති ලක්ෂණ නිර්වාණ ධාතුව සුවසේම අවබෝධ කර ගැනීම පිණිසම හේතුවේවා! වාසනාවේවා! කියා නිවන් සුව ප්‍රාර්ථනා කරමු!

*සාදු! සාදු! සාදු!*